# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No – 10120

ෆැක්ස් / தொலைநகல / Fax – 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone – 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site – www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail – dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO – 1400/ 2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No – / 2024

දිනය / திக / Date – 29/08/2024 පැය 1230

**මාධ්‍ය නිවේදනය**

**කුරුණෑගල , රිදිගම රිදි විහාර ඇසල මහ පෙරහර හේතුවෙන් වාහන ගමනාගමනය සීමා කිරීම.**

රිදීගම පොලිස් වසමේ රිදිගම රිදි විහාරයේ අවසන් ඇසළ මහ රන්දෝලි පෙරහර 2024.08.30 වන දින සවස 0630 සිට රිදීගම නගරය ආශ්‍රිතව විථි සංචාරය කිරීමට නියමිතව ඇත.

මෙම පෙරහර ඉහත කාලය තුළ විහාරස්ථානයෙන් ආරම්භ වී කුරුණෑගල - කැප්පැටිගල මාර්ගයේ හුණුගල්කඩුල්ල හංදියේ සිට රිදීගම නගරය දක්වා සහ කටුපිලගොල්ල හන්දියේ සිට රිදීගම නගරය දක්වාත්, මාතලේ - රිදීගම මාර්ගයේ රුක්අත්තනගහ හන්දිය සිට රිදීගම නගරය දක්වා ගමන් කර නැවත විහාරස්ථානය වෙත පැමිණීමට නියමිතය.

ඉහත මාර්ගය භාවිතා කරන මහජනතාව සහ රියදුරන් පහත විකල්ප මාර්ගයන් භාවිතා කරන ලෙස පොලිසිය මහජනතාවගෙන් ඉල්ලා සිටී.

**විකල්ප මාර්ග**

- ✓ කුරුණෑගල දෙස සිට රිදීගම නගරය හරහා කැප්පැටිගල දෙසට ගමන් කරන රථවාහන හුණුගල්කඩුල්ල හන්දියෙන් හරවා මොරතිහ,කටුපිලගොල්ල හරහා කැප්පැටිගල දක්වා ගමන් කල හැක.

- ✓ කැප්පැටිගල දෙස සිට රිදීගම නගරය හරහා කුරණෑගල දෙසට ගමන් කරන රථවාහන කටුපිලගොල්ල හන්දියෙන් හරවා මොරතිහ, හුණුගල්කඩුල්ල හරහා කුරුණෑගල දෙසට ගමන් කළ හැක.

- ✓ මාතලේ - මදුරාගොඩ දෙස සිට රිදීගම දෙසට ගමන් කරන වාහන රුක්අත්තන හන්දියෙන් තල්ගොඩපිටියට ගමන් කර කුරුණෑගල - දඹුල්ල මාර්ගය භාවිතා කළ හැක.

ඉහත නිවේදනය මහජනතාවගේ සහ රියදුරන්ගේ දැන ගැනීම සඳහා ඔබ මාධ්‍ය මගින් ප්‍රචාරයක් ලබාදීමට අවශ්‍ය කටයුතු සිදු කරන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**